# FINANCIAL MANAGEMENT (Part-VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# කොළඹ කොටස් හුවමාරුව

කොළඹ කොටස් හුවමාරුව ලැයිස්තුගත සමාගම්වල කොටස් මිල දී ගැනීම හා විකිණීම පරිපාලනය කරන ආයතනය කොළඹ කොටස් හුවමාරුව ලෙස හැඳින්වේ.

කොළඹ කොටස් හුවමාරුව ඇපයෙන් සීමිත සමාගමකි. එහි පූර්ණ සාමාජිකයන් ලෙස තැරැව්කාර සමාගම් ක්‍රියාත්මක වේ. මෙම තැරැව්කාර සමාගම් කොළඹ කොටස් හුවමාරුවේ අතරමැදියන් ලෙස කටයුතු කරයි.

කොළඹ කොටස් හුවමාරුවේ කාර්ය විධිමත් කිරීමේ හා අධීක්ෂණය කිරිම ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ. කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වීමට හේතු කීපයක් පහත දැක්වේ.

ClassWork.LK

# කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වීමට හේතු

- පුද්ගලයන් හා ආයතන ආයෝජනය සඳහා දිරිගැන්වීම.
- ආයෝජකයන්ට, කොළඹ කොටස් හුවමාරුව හරහා විවිධ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම.
- සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.
- සමාගම්වල කොටස් සඳහා ද්විතීයක වෙළෙඳ පොළක් ඇති වීම.
- විදේශ ආයෝජකයන් රටට අද්දවා ගත හැකි වීම.

ClassWork.LK

- රජයේ සුරැකුම්පත් අලෙවි කිරිමෙන් රජයට අවශ්‍ය අරමුදල් ලබා ගත හැකි වීම.

- සමාගම්වල කොටස්වලට වටිනාකමක් නිර්මාණය වීම.

- සමාගම්වල කීර්තිනාමය හා ප්‍රතිරූපය ඉහළ යාම.

## ප්‍රාථමික වෙළෙඳ පොළ

කොටස් නිකුත් කරන සමාගමකින් ආයෝජකයින් විසින් සෘජුවම කොටස් මිලට ගැනීම ප්‍රාථමික වෙළෙඳ පොළ යි.

## ද්විතීයක වෙළෙඳ පොළ

කොළඹ කොටස් වෙළෙඳ පොළෙන් ආයෝජකයන් කොටස් මිල දී ගැනීම ද්විතීයක වෙළෙඳ පොළ යි.

ClassWork.LK

# සීමිත පොදු සමාගමකට කොළඹ කොටස් හුවමාරුවේ ලියාපදිංචි විය හැකි ආකාර

- **මූලික ප්‍රසිද්ධ නිකුතුවක් (Initial public offer) මඟින්**

සමාගමක් පළමු වරට කොටස් නිකුත් කිරීමක් මගින් මහජනයාට දායක වීමට ඇරියුම් කර කොටස වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීම.

- **විකුණුම් අර්පණයක් (offer for sale) මඟින්**

දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක්, මහජනතාව සතුව ඇති කොටස් වෙළෙඳ පොළෙන් විකිණීමට ඉදිරිපත් කිරීම සඳහා ලැයිස්තු ගත කිරීම.

- **හඳුන්වා දීමක් (Introduction) මඟින්**

මහජනතාවට කොටස් නිකුත් කිරීමක් නොකර හඳුන්වාදෙන අවස්ථාවේදී ම කොළඹ කොටස් හුවමාරුව හරහා ම කොටස් නිකුත් කිරීම.

ClassWork.LK

# කොටස් වෙළෙඳ පොළ සමාගම් ලැයිස්තු ගත කිරීම

කොටස් වෙළෙඳ පොළේ සමාගම් ලැයිස්තු ගත කිරීමේ දී සියලු ම සමාගම් පුවරු 2ක් යටතේ ලැයිස්තුගත කිරීම සිදු කෙරේ.

1. ප්‍රධාන පුවරුව ( Board)Main Board)
2. දිරිසවි පුවරුව (Dirisavi )

## ප්‍රධාන පුවරුව

විශාල ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත සමාගම් සඳහා වෙන් වූ පුවරුව ප්‍රධාන පුවරුව යි. ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා කීපයකි.

ClassWork.LK

## ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීම සඳහා සපුරා ලිය යුතු අවශ්‍යතා

- සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ට නොඅඩු වීම.

- ලැයිස්තුගත වීමට ඉල්ලුම් කරන දිනට පෙර අවම වශයෙන් අඛණ්ඩ ව වසර 3ක් බදු පෙර ශුද්ධ ලාභ ලබා තිබීම.

- ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම්, ලැයිස්තු ගත කිරීමට ඉලලුම් කළ දිනයේ සිට ආසන්න වර්ෂ දෙකක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් තහවුරු වීම. නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 25%ක් මහජනයා සතු වීම.

ClassWork.LK

# දිරි සවි පුවරුව

සීමිත ප්‍රකාශිත ප්‍රාග්ධනයක් සහිත ව ආරම්භ වූ සමාගම් ලැයිස්තුගත කිරීමට වෙන්වූ පුවරුව දිරි සවි පුවරුව යි.

## දිරි සවි පුවරුවේ ලැයිස්තුගත වීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා

- සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් කෝටි 10ට නොඅඩු විය යුතු ය.
- නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් අවම වශයෙන් 10%ක් මහජනයා සතු විය යුතු ය.
- ව්‍යාපාරයේ පවතින ශුද්ධ වත්කම් ලැයිස්තුගත කිරීමට ඉල්ලුම් කළ දිනට, වසරක විගණනය කරන ලද මූල්‍ය වාර්තා මඟින් තහවුරු විය යුතු ය.
- සමාගමේ ක්‍රියාකාරි කාල සීමාව අවම වශයෙන් වසරක් වීම.

ClassWork.LK

# වොච් ලිස්ට් පුවරුව

කොටස් වෙළෙඳ පොළෙහි ලැයිස්තුගත කිරීමේ කොන්දේසි කඩ කරන හෝ නො පිළිපදින සමාගම් ඇතුළත් කරන පුවරුව වොච් ලිස්ට් පුවරුව ලෙස හැඳින්වේ. මෙය පෙර කඩ කළ පුවරුව ලෙස හඳුන්වා ඇත.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura